# 1.34 එපික් රංග සම්ප්‍රදාය හා දයානන්ද ගුණවර්ධන

එච්.එම්.කේ. හේරත්
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. කැලණිය.

## ABSTRACT

එපික් රංග සම්ප්‍රදාය ජර්මන් ජාතික අර්වින් පිස්කැටෝර් (Erwin Friedrich Mari Piscator 1893-1966) විසින් ආරම්භ කරන ලද රංග සම්ප්‍රදායකි. පිස්කැටෝර්ගේ සමකාලීනයකු වූ බර්ටෝල්ට් බ්‍රෙස්ට් ඉහත රංග සම්ප්‍රදාය වඩා වර්ධනය කළේ ය. ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයෙහි දැක්වෙන පරිදි එපික් යනු වීරයින් පිළිබඳ සඳහන් වන කතාපුවත් වේ. ඒවා වීර කාව්‍ය ගණයට අයත් ය. උක්ත එපික් රංග ක්‍රමය වීර කාව්‍යවලින් වෙනස් වන්නේ ය. වාර්තාමය ස්වරූපයෙන් යුක්ත මෙම නාට්‍යයන්හි අන්තර්ගතය තත්කාලීන සමාජ යථාර්ථය හෝ ඓතිහාසික පුරාවෘත්ත හෝ ආගමික තොරතුරු හෝ දේශපාලන තොරතුරු හෝ ප්‍රචාරක ස්වරූපයෙන් අනාවරණය කෙරෙන්නක් විය. රංග භූමිය සකස් කිරීමේ දී කාර්මික ඥානය භාවිතය හා විවිධ රංගෝපක්‍රම භාවිතය පැවති සම්ප්‍රදායන් අබිබවා යන්නක් විය. අන්‍යෝන්‍ය වශයෙන් දැඩි සේ බද්ධ නො වූ සිද්ධි නිරූපණය පූර්වෝක්ත රංග ක්‍රමයට අනන්‍ය ලක්ෂණයකි.

එපික් රංග සම්ප්‍රදාය දේශීය වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයට හඳුන්වා දීමේ ගෞරවය හිමිවන්නේ දයානන්ද ගුණවර්ධන නාට්‍යවේදියාට ය. ඔහු ජර්මනිය වැනි රටවල කළ සංචාරයන්හි ප්‍රතිඵලයක් වශයෙන් එපික් රංග නාට්‍ය නරඹා ඉන් ලද ආභාසය පදනම් කර ගනිමින් එපික් නාට්‍ය තුනක් රචනා කොට නිෂ්පාදනය කළේ ය. ඒ සඳහා ඔහු මුල පුරන්නේ 70 දශකයේ මුල් භාගයේ **ගජමන් පුවත** (1975) රචනා කොට නිෂ්පාදනය කිරීමෙනි. ඉන්පසු **මධුර ජවනිකා** (1983), **ආනන්ද ජවනිකා** (1986) රචනා කොට නිෂ්පාදනය කරමින් එය වඩා වර්ධනය කළේ ය.

එපික් රංග සම්ප්‍රදායට අයත් මූලික ලක්ෂණ දේශීය නාට්‍ය ක්ෂේත්‍රයට සුදුසු පරිදි අනන්‍යතාවක් සහිත ව නිර්මාණය කර තිබීම උක්ත නාට්‍යයන්හි කැපී පෙනෙන ලක්ෂණයකි. එසේ ම බටහිර රංග සම්ප්‍රදායන්හි ආභාසය මගින් ලාංකේය වේදිකා නාට්‍ය ක්ෂේත්‍රය පෘථුල කිරීමට ගුණවර්ධන නම් නාට්‍යවේදියා ගත් උත්සාහය ඉහත නාට්‍ය නිර්මාණ මගින් තහවුරු වෙයි. බටහිර එපික් නාට්‍ය හා ගුණවර්ධනගේ උක්ත නාට්‍ය කෘති සන්සන්දනය කිරීමෙන් ඒ බව පැහැදිලි වෙයි.

දයානන්ද ගුණවර්ධනගේ උක්ත නාට්‍ය 3 අයත් වන්නේ එපික් රංග සම්ප්‍රදායට නොව වාර්තා රංග (Documentary Drama) නමැති සම්ප්‍රදායටයි. එපික් රංගය හා වාර්තා රංගය අතර පැහැදිලි වෙනස්කම් ඇත.